# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2323/25 - 2023 මාර්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DIVKW/LND/ACQA/4-D/40.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2018/PC/334.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කටුගම්පල හත්පත්තුවේ දකුණු යටිකහකෝරලේ අංක 1166 පහළ පිදුම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිදුම ගමේ අ.ග.පි. 976 හි අතිරේක අංක 15 හි කැබලි අංක 76 සහ අ.ග.පි. 1948 හි අතිරේක අංක 23 හි කැබලි අංක 366 වශයෙන් දැක්වෙන පහත මායිම්වලට අයත් බිම් කැබලි:

01. **කැබලි අංක 76**
ඉඩමේ නම: මැක්ෂිවත්ත, කෝන්ගහමුලවත්ත; ඉඩම් පරිහරණය: (වත්ත) අවුරුදු 10-15 ක් පමණ වයසැති මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: සෙම්බුකුට්ටි ආරච්චිගේ පුෂ්පකුමාර උපාලි ගුණවර්ධන, බිහල්පොල, නක්කාවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0147.

***මායිම් :***
*උතුරට* : පිදුම (අ.ග.පි. 1948); *නැගෙනහිරට* : පිදුම (අ.ග.පි. 1948); *දකුණට* : 2 වැනි බිම් කැබැල්ල; *බටහිරට* : 2 වැනි බිම් කැබැල්ල සහ පිදුම (අ.ග.පි. 1948).

02. **කැබලි අංක 366**
ඉඩමේ නම: මැක්ෂිවත්ත, අස්වැද්දුමවත්ත; ඉඩම් පරිහරණය: (වත්ත) අවුරුදු 10-15 ක් පමණ වයසැති මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: සෙම්බුකුට්ටි ආරච්චිගේ පුෂ්පකුමාර උපාලි ගුණවර්ධන, බිහල්පොල, නක්කාවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0920.

***මායිම් :***
*උතුරට* : 365 සහ 361 වැනි බිම් කැබලි; *නැගෙනහිරට* : පිදුම 361 සහ 57 වැනි බිම් කැබලි; *දකුණට* : 57 වැනි බිම් කැබැල්ල සහ අස්වැද්දුම (අ.ග.පි. 976); *බටහිරට* : අස්වැද්දුම (අ.ග.පි. 976) සහ මෙම පිඹුරේ 57 සහ 365 වැනි බිම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 ජුනි මස 26 වැනි දින පෙ.ව. 10.00 ට කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද 2023 ජුනි මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩී. එම්. ඒ. කේ. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
කුලියාපිටිය බටහිර.

2023 මාර්තු මස 10 වැනි දින,
කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0184

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DSM/NU/LND/7/23/-vi.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/10/2020/MV/288-E.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මෙහි මහජන කටයුත්ත යනු වයඹ පළාතේ ඇළ ව්‍යාපෘතියට අදාළ බෝවතැන්න උමං මාර්ගය සහ නිර්මිත ඉදිකිරීම සඳහා ඉඩම් කොටස්වල පරවශතාවය අත්කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඊ 414සී වැවත්තැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පෙනලබොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2023.02.28 දින සම්මත කරන ලද ක.සි. අංක 310199, කලාප අංක 03 හා පත්‍ර අංක 1 හි පහත සඳහන් කර ඇති කැබලි 1 (උපලේඛනයේ සඳහන් කර ඇත.):

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: උඩළිඳමූකලාන, කන්දේයාය, පිහිල්ලේමූකලාන, පනහවැල්ලගහමූකලාන, කුඹිබිලියහේන, මහපතනේමූකලාන, හින්දඹගොල්ලමූකලාන, අරංගලමූකලාන සහ මහමූකලාන; විස්තරය : කැලෑව; හිමිකම් කියන අය : රජය; ප්‍රමාණය: හෙක්. 1.2001.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 අප්‍රේල් මස 04 වැනි දින පෙ.ව. 10.00 ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද 2023 මාර්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එස්. විජයකුමාර්,
ප්‍රාදේශීය ලේකම් (වැ. බ.),
නාඋල.

2023 මාර්තු මස 13 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0185

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.